මාධ්‍ය නිවේදනය

2018 නොවැම්බර් 13, කොළඹදී...

Good Food, Good Life

# නෙස්ලේ සමාගම මෙරට කිරි කර්මාන්තයේ සිය ආයෝජනය තවත් පුළුල් කරමින් තෙවැනි කිරි ශීතාගාරය මන්නාරම දිස්ත්‍රික්කයේදී විවෘත කරයි

ප්‍රදේශවාසී කිරි ගෙවිලියන් සවිබල ගැන්වීමේ විශිෂ්ට පියවරක්

මෙරට තුළ කිරි ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනයෙහිලා තම ශක්තිමත් දායකත්වය තවදුරටත් ක්‍රියාත්මක කරමින් නෙස්ලේ සමාගම සිය තෙවැනි කිරි ශීතාගාරය මන්නාරම දිස්ත්‍රික්කයේ උතුරු මඩු ප්‍රදේශයේදී පසුගියදා විවෘත කළේය. ශ්‍රී ලංකාව ඝර්ම කලාපීය රටක්වන බැවින් කිරි ශීතාගාර පැවතීම අතිශය වැදගත්වන අතර රැස්කරගන්නා කිරි කුරුණෑගල පිහිටි නෙස්ලේ කර්මාන්තශාලාව වෙත ගෙන යන තෙක් නැවුම්ව තබාගැනීමට මෙම ශීතාගාර උපකාරී වේ. මෙම ව්‍යාපෘතිය, දැනට ශ්‍රී ලංකාවේ කිරි ගොවීන් 20,000කට පමණ සහාය දක්වන දිවයින පුරා නෙස්ලේහි පුළුල් කිරි එකතුකිරීමේ ජාලයේ දිගුවක් ලෙස සඳහන් කළ හැක. මෙම නව ශීතාගාරය මඩු ප්‍රදේශයේ වෙසෙන කිරි ගොවීන් 300 දෙනෙකුට පමණ නිසි වෙළෙඳපොළක් බිහිකරදෙමින් ප්‍රතිලාභ සලසා දෙන අතර ඔවුන්ගෙන් වැඩිදෙනා කාන්තාවන් වීම කැපීපෙනේ.

"අපි දේශීය කිරි ගොවීන් හා දිගින් දිගටම එක්ව කටයුතු කරන නිසාත්, උසස් ප්‍රමිතියේ කිරි නිෂ්පාදනය සඳහා අවශ්‍ය පුහුණුව සහ සම්පත් ඔවුන්ට සපයන නිසාත් අපගේ කිරි සැපයුම් ජාලයේ වර්ධනයට සමගාමීව අපගේ කිරි නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීමටත් පියවර ගෙන තිබෙනවා. ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය ස්වයංපෝෂිත කිරීම සඳහා දායකවීමට ආරම්භයේ සිට මේ දක්වා අපි දිගු ගමනක් පැමිණ තිබෙනවා. ඒ තුළ අද වන විට උසස් ප්‍රමිතියේ කිරි දේශීය කිරි ගොවීන්ගෙන් ලබාගැනීමට අපට හැකිවීමත් මහත් සතුටක්. ඒ වගේම දේශීය ශ්‍රම බලකාය තුළ කාන්තා දායකත්වයේ වර්ධනය අවශ්‍යම මොහොතක අපගේ කිරි ගොවි ජාලයේ සියයට 30 පමණ දෙනා කාන්තාවන් වීමත් අපට විශාල අභිමානයක්. දියුණු සහ සැමගේ සහභාගීත්වයෙන් දේශීය කිරි කර්මාන්තයක් සංවර්ධනය කිරීම මගින් උසස් ප්‍රමිතියේ කිරි නිෂ්පාදන සාධාරණ මිලකට අපිට වෙළෙඳපොළට නිකුත් කිරීමට හැකිවෙනවා වගේම ග්‍රාමීය සංවර්ධනය හා ආර්ථික වර්ධනය අත්කරගැනීමට එය ගාමක ශක්තියක් බවටත් පත්වනවා" යනුවෙන් නෙස්ලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය පැවසුවාය.

නෙස්ලේ නව කිරි ශීතාගාරය පිහිටුවන ලද්දේ මඩු සත්ත්ව අභිජනනකරුවන්ගේ ජීවිකා ස්වචේඡා සමිතියේද සහයෝගයෙනි. මීට පෙර සමාගමේ ආසන්නතම ශීතාගාරය පිහිටියේ වව්නියාවේය; ආසන්න වශයෙන් කිලෝ මීටර 20ක් දුරින් ය. ඒ හේතුවෙන් නෙස්ලේ සමාගමට මෙම කිරි ගොවීන්ගෙන් කිරි ලබාගත හැකිවූයේ දිනකට එක් වරක් පමණි. ඒ ද හිමිදිරි උදෑසනදී ය. නමුත් නව කිරි ශීතාගාරය හරහා දිනකට දෙවරක් කිරි රැස් කිරීමට නෙස්ලේ සමාගමට හැකිවන අතර කිරි ගොවීන්ට ද කිරි දෙවීම සඳහා උදෑසන වැඩි කාලයක් ගතකිරීමට අවස්ථාව උදාවී තිබේ.

"ඉස්සර අපේ කිරි ගොවීන් තමන් රැස් කරන කිරිවලින් නියම ප්‍රයෝජනය ගන්න බැරිව ළතැවුණා. නමුත් නෙස්ලේ අනුග්‍රහයෙන් අපට ලැබුණු මේ නව පහසුකම නිසා දැනට දිනකට අපි නිපදවන කිරි ලීටර 1,500ක ප්‍රමාණය ලබන වසරේ සිට ලීටර් 5,000ක් දක්වා වැඩිකිරීමට අපි බලාපොරොත්තු වෙනවා" යැයි මන්නාරම අතිරේක දිස්ත්‍රික් ලේකම් සිවබාලන් කුනබාලන් මහතා පැවසීය.

නෙස්ලේ, මේ වන විට මෙරට පෞද්ගලික අංශයේ සිටින විශාලතම නැවුම් කිරි එකතුකරන සමාගම වේ. තමන් සතු ගෝලීය කිරි විශේෂඥතාවය සහ ස්විස් කිරි දිස්ත්‍රික්ක ආදර්ශය අනුව යමින් නෙස්ලේ සමාගම දේශීය කිරි ගොවීන්ට පුළුල් පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් දේශීය කිරි සැපයුම සඳහා මනා යටිතල පහසුකම් දාමයක් ද සකසා තිබේ. මෙම නෙස්ලේ ආදර්ශ මාදිලියට අනුව මෙම ශීතාගාර මෙහෙයවනු ලබන්නේද දේශීය තෙවැනි පාර්ශ්වීය සහකරුවන් විසිනි. ඒ හරහා නෙස්ලේ වෙත නැවුම් කිරි ලබාදීමට අමතරව තවත් ආදායම් මාර්ගයක් සපයාගැනීමට ද දේශීය ප්‍රජාවට හැකිව තිබේ.

මෙම කිරි සංවර්ධන වැඩසටහනට අනුව නෙස්ලේ සමාගම දේශීය කිරි ගොවීන්ට අඛණ්ඩ පුහුණු වැඩසටහන් පිරිනමයි. ඒ හරහා ගවයින්ට ආහාර සැපයීම සහ අභිජනනය, සත්ත්ව සෞඛ්‍යය හා ගොවිපොළ කළමනාකරණය ආදී තාක්ෂණික දැනුම මෙන්ම යහපත් ව්‍යාපාර භාවිතාවන් පිළිබඳ දැනුම ද පිරිනැමේ. එමෙන්ම කිරි ගොවිපොළ සංවර්ධනයට වුවමනා වටිනා උපකරණ, ඖෂධ මෙන්ම මූල්‍ය සහාය ද නෙස්ලේ සමාගම ලබාදෙන අතර රජය හා සහයෝගීතාවයෙන් යුතුව ජංගම පශු වෛද්‍ය සායන ද සංවිධානය කරයි.

කිරි කර්මාන්තය තුළ නෙස්ලේ සමාගමේ දීර්ඝ කාලීන පෙනීසිටීම මෙන්ම නිරන්තර සහාය පිරිනැමීම නිසා කාන්තාවන්ගේ සහභාගීත්වය විශාල ලෙස වර්ධනය වී තිබේ. විශේෂයෙන්ම නිසි වේලාවට ගෙවීම් සිදුකිරීම, නිරන්තර පුහුණුකිරීම් හා පුළුල් තාක්ෂණික දැනුම ලබාදීම ඊට ප්‍රධානවම බලපා ඇත. 2017 වසරේදී පමණක් නැවුම් කිරි සපයා ගැනීම වෙනුවෙන් නෙස්ලේ සමාගම රුපියල් බිලියන 3.5ක් දේශීය කිරි ගොවීන් වෙත ලබාදී ඇත.

මෙම නවතම කිරි ශීතාගාරය විවෘත කිරීම, මන්නාරම අතිරේක දිස්ත්‍රික් ලේකම් සිවබාලන් කුනබාලන් මහතාගේ සහ නෙස්ලේ කළමනාකාර අධ්‍යක්ෂිකා ෂිවානි හෙග්ඩේ මහත්මියගේ සුරතින් සිදුවූ අතර එම අවස්ථාවට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය සිංහරාජා විමලකුමා, මඩු ප්‍රාදේශීය ලේකම් බාලක්‍රිෂ්ණන් ජයකරන්, 611 හමුදා බළකායේ කර්නල් බන්දුල අබේරත්න, මඩු පශු ශල්‍ය වෛද්‍ය කේ. කිරුබාකරන්, නෙස්ලේ උප සභාපති (තාක්ෂණ) තෝමස් මුලර් සහ නෙස්ලේ උප සභාපති (ආයතනික සබඳතා සහ සන්නිවේදන) බන්දුල එගොඩගේ යන මහත්වරුද සහභාගී වූහ.